## චතාරික සමයේ තුන්වන සතිය
## බදාදා

## පළමුවන කියැවීම

ද්විතිය නීති සංග්‍රහයෙන් ගත් පාඨයෙකි.

ද්විතීය නීති සංග්‍රහය 4: 1, 5-9

### දේව නීතිය දැනගෙන අනුසාර කරන්න.

මෝසෙස් ඉශ්රායෙල්වරුන්ට කතා කොට මෙසේ කීය. "ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඔබට දෙන්නට යන දේශයට ඇතුළු වී, එය අයිති කරගෙන ජීවත් වන පිණිස ඔබ විසින් ඉටු කළයුතු මා ඔබට උගන්වන නීති හා නියෝගයන්ට ඉශ්රායෙල්වරුනි, දැන් ඉතින් සවන් දෙන්න.

"මාගේ දෙවි සමිඳාණන් වහන්සේ මට අණ කළ පරිදි මම ඔබ හට නීති හා නියෝග ඉගැන්වීමි. ඔබ අයිති කරගන්නට යන රටට ඔබ ගිය පසු ඒවා පිළිපැදිය යුතුය. ඒවා ආරක්ෂා කරමින් පිළිපදින්න. මෙසේ කිරීමෙන් සෙසු ජාතීන් ඉදිරියෙහි ඔබේ පැණවත්කමත්, නැණවත්කමත් කැපී පෙනෙනු ඇත. මේ නීති සියල්ල ගැන ඔවුන්ට සැලවන විට මේ ශ්‍රේෂ්ඨ ජාතියට අයිති සෙනඟ කෙතරම් පැණවත් ද නැණවත් ද කියා ඔවුන් විස්මපත් වනු ඇත."

"අපේ දෙවි සමිඳාණන් වහන්සේගෙන් අප අයදින සියල්ලෙහි දී, උන් වහන්සේ අපට ළංව සිටින්නාක් මෙන් වෙන කිනම් ශ්‍රේෂ්ඨ ජාතියකට දෙවි කෙනෙක් ළංව සිටින්නේ ද? මා අද දින ඔබ ඉදිරියෙහි තැබූ මේ සියලු නීති

මෙන් සාධාරණ නීති හා නියෝග වෙන කිනම් ශ්‍රේෂ්ඨ ජාතියක් සතුව පවතී ද? පරෙස්සම් වන්න. ඔබේ ඇසින් ඔබ දුටු දේවල් අමතක නොවන පිණිසත්, දිවි ඇතිතාක් ඒවා ඔබේ සිතින් පහ වී නොයන පිණිසත්, ඒවා මැනවින් සලකා බලන්න. ඒවා ඔබේ දරුවන්ටත්, දරුවන්ගේ දරුවන්ටත් කියා දෙන්න.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 147 : 12-13, 15-16, 19-20

පිළිතුර: ජෙරුසලම! සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

ගීය:

එම්බා ජෙරුසලම! සමිඳුන්ට ප්‍රශංසා කරන්න. සියොන් ගිර තිගේ දෙවිඳුන්ට ප්‍රශංසා කරන්න.
මන්ද එතුමාණෝ තිගේ වාසල් දොරටුවල අගුල් සවිමත් කළ සේක. තිගේ දරුවන්ට ආශිර්වාද කළ සේක.

එතුමාණෝ ස්වකීය ආඥාව පොළොවේ ඉම දක්වා යවන සේක. එතුමන්ගේ වචන යුහුව පැතිර යයි. එතුමාණෝ බැටළු හම් මෙන් හිම වස්වන සේක. අළු මෙන් පිණිකැට විසුරුවන සේක.

එතුමාණෝ ජාකොබ්ට සිය වචනය ද ඉශ්‍රායෙල්ට සිය පණත් හා නියමයන් ද ප්‍රකාශ කරන සේක. එතුමාණෝ වෙන කිසි ජාතියකට

මෙසේ නොකළ සේක. ඔව්හු එතුමන්ගේ නියමයන් දැන නොගත්තෝය. සමිඳුන්ට ප්‍රශංසා වේවා!

## සාධුකාරය

"ලෝකයේ ආලෝකය මම ය. මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි ස්වාමීන් වහන්සේ වදාරණ සේක.

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 5 : 17 –19

***අණ පණත් අනුසාර කර අන් අයට උගන්වන්නා ස්වර්ග රාජ්‍යයෙහි උතුම් වන්නේය.***

"මම ව්‍යවස්ථාවලිය හා දිවැසිවලිය අවලංගු කරන පිණිස ආවෙමි"යි නොසිතන්න. මා ආයේ ඒවා අවලංගු කිරීමට නොව, සම්පූර්ණ කිරීමට ය. සැබැවින් ම මම ඔබට කියමි. අහස හා පොළොව පහව ගියත්, සියල්ල පරිපූර්ණ වන තුරු ව්‍යවස්ථාවලියෙන් ඉස්පිල්ලක් වත් පාපිල්ලක් වත් පහවී නොයන්නේ ම ය. එබැවින් මේ ආඥා වලින් ඉතා සුළු එකක් වත් කඩකරන හෝ කඩ කරන ලෙස මිනිසුන්ට උගන්වන හෝ කවරෙකු වුව ද ඔහු ස්වර්ග රාජ්‍යයෙහි ඉතා සුළු ය යි කියනු ලබන්නේය. එහෙත් ඒවා

පිළිපදින, ඒවා උගන්වන කවරෙකු වුව ද, ඔහු ස්වර්ග රාජ්‍යයෙහි උතුම් යයි කියනු ලබන්නේය.

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**